අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක : **06/2025**

මගේ අංකය : ED/04/60/03/04/නව ව්‍යවස්ථාව 2 වෙළුම-SUB1
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල
2025............ මස ............ වන දින

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථාවේ සඳහන් සන්ධාන භාෂා ප්‍රවීණතා අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම**

2008.07.01 දින සිට ක්‍රියාත්මක අංක 1885/31 හා 2014.10.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා විදුහල්පති නව සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 9.1 වගන්තිය අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සෑම නිලධාරියෙකුම බඳවා ගැනීමේ දින සිට වසර තුන (03) ක් ඇතුළත සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

02. එසේම, එකී සේවා ව්‍යවස්ථාවේ 9.1 වගන්තිය අනුව යම් නිලධාරියෙකු අ.පො.ස (සා.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබේ නම් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 08/2020 අනුව 2020.07.01 දින සිට එහි සඳහන් සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලබන අතර සෙසු නිලධාරීන් සේවා ව්‍යවස්ථාවේ "ඇ" පරිශිෂ්ටයේ සඳහන් ශ්‍රී ලංකා විදුහල්පති සේවය සඳහා වූ ඉංග්‍රීසි භාෂා පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

03. අංක 2076/14 හා 2018.06.19 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවේ දෙවන සංශෝධනයේ 18 අන්තර්කාලීන විධිවිධාන යටතේ මෙම සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාවේ 9.1 යටතේ දක්වා ඇති සන්ධාන භාෂා ප්‍රවීණතා අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇත.

04. එබැවින්, අංක 1885/31 හා 2014.10.22 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නව සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ගේ ශ්‍රේණි උසස්වීම් සඳහා සන්ධාන භාෂා ප්‍රවීණතා අවශ්‍යතාවය හැර අනෙකුත් සියලු සුදුසුකම් සපුරා ඇත්නම් එම නිලධාරීන්ගේ ශ්‍රේණි උසස්වීම් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කළ හැකි වේ.

05. ශ්‍රී ලංකා විදුහල්පති සේවයට බඳවා ගැනීමේ දින සිට වසර තුන (03) ක් ඇතුළත සන්ධාන භාෂා ප්‍රවීණතා අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට අපොහොසත් වන, අංක 1885/31 හා 2014.10.22 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුව බඳවාගනු ලැබූ නිලධාරීන්ගේ තුන්වන වැටුප් වර්ධකයේ සිට වාර්ෂික වැටුප් වර්ධක අදාළ සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනය දක්වා තාවකාලිකව නතර කරනු ලැබේ.

06. එසේම, ඉහත 05 ඡේදයේ සඳහන් පරිදි වැටුප් වර්ධක තාවකාලිකව නතර කරනු ලැබූ නිලධාරියෙකු තමාගේ II ශ්‍රේණියේ උසස්වීම ලැබීමට නියමිත දිනට අදාළ සන්ධාන භාෂා ප්‍රවීණතාවය ලබා ගැනීමට අපොහොසත් වුයේ නම් එම උසස්වීම ලැබීමට නියමිත දිනයේ සිට ප්‍රමාදවන කාලයට සමාන කාලයකින් එම උසස්වීම ප්‍රමාද කිරීමට කටයුතු කරනු ලැබේ.

07. මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත නිකුත් කරනු ලැබේ.

08. මෙම චක්‍රලේඛය භාෂා ත්‍රිත්වයෙන්ම පළකර ඇති අතර, භාෂාවන් අතර අනනුකූලතාවයක් පවතින්නේනම් සිංහල භාෂාවෙන් ප්‍රසිද්ධ කර ඇති චක්‍රලේඛය අනුව කටයුතු කළයුතු වේ.

නාලක කලුවැව
ලේකම්